ET/SSS/2022(2023)/OL/33/S/Q/S-4

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

G. C. E. Ordinary Level | අ. පො. ස. සාමාන්‍ය පෙළ | 2022 (2023)

# Student Seminar Series

# ශිෂ්‍ය සම්මන්ත්‍රණ මාලාව

Practice Paper | උපකාරක ප්‍රශ්න පත්‍ර

# History

# ඉතිහාසය



**Question Paper - I, II | ප්‍රශ්න පත්‍රය - I, II (සිංහල මාධ්‍යය)**

Nenasa
The National e-learning Portal for The General Education
දූරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව | ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව

දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය

கல்வி அமைச்சு

Ministry of Education, Sri Lanka

| 33 | S | I, II |
|---|---|---|

අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2022 (2023)

கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை- ஆதரவு கருத்தரங்கு தொடர்- 2022 (2023)

G. C. E. Ordinary Level Examination - Support Seminar Series - 2022 (2023)

| | |
|---|---|
| ඉතිහාසය | I, II |
| வரலாறு | I, II |
| History | I, II |

පැය තුනයි.
மூன்று மணித்தியாலம்
Three Hours

| | |
|---|---|
| අමතර කියවීම් කාලය | - මිනිත්තු 10 යි. |
| மேலதிக வாசிப்பு நேரம் | - 10 நிமிடங்கள் |
| Additional Reading Time | – 10 minutes |

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

## ඉතිහාසය I

**සැලකිය යුතුයි:**

* **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් සුදුසු** පිළිතුර තෝරාගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ ( X ) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. ශ්‍රී ලංකාවේ පැරණිතම දේශීය සාහිත්‍ය මූලාශ්‍රය වන දීපවංශයඉතිහාසය හැදෑරීමේ , මූලාශ්‍රයක් ලෙස යොදා ගැනීමේ දී පවතින දුර්වලතාවක් වන්නේ,
   (1) මහසෙන් රාජ්‍ය සමය අවසානය දක්වා අඛණ්ඩව තොරතුරු ලබාගත හැකිවීමයි.
   (2) ශාසන ඉතිහාසය සම්බන්ධ තොරතුරු ඇතුළත් වීමයි.
   (3) තොරතුරු ඉතා කෙටියෙන් සඳහන් වීම හා පුනරුක්ති දෝෂ පැවතීමයි.
   (4) දේශපාලන තොරතුරු ඇතුළත්ව තිබීම යි

2. ගම්පොළ රාජ්‍ය සමයේ සිට කෝට්ටේ රාජ්‍ය සමය දක්වා මෙරට දේශපාලන ඉතිහාසය හැදෑරීමේ දී , වැදගත් කෘතියක් වන්නේ මින් කුමක් ද?
   (1) නිකාය සංග්‍රහය (2) පූජාවලිය
   (3) සද්ධර්මාලංකාරය (4) රාජාවලිය

3. මෙරටින් හමුවන පැරණි ම කාසිය හඳුන්වනු ලබන්නේ,
   (1) කහාපණ යනුවෙනි. (2) අලියා හා ස්වස්තික කාසිය යනුවෙනි.
   (3) ලක්ෂ්මී කාසිය යනුවෙනි. (4) තඹ මස්ස යනුවෙනි.

4. පහත ස්ථාන අතරින් ප්‍රාග්ඓතිහාසික ගල් යුගයට අයත් පැරණිම සාක්ෂි හමු වී ඇති ස්ථානය කුමක් ද?
   (1) බූන්දල වැල්ලේගංගොඩ (2) පතිරාජවෙල
   (3) උඩමළල (4) මිනිහාගල්කන්ද

5 .ශ්‍රී ලංකාවට නොපැමිණ ලංකාව පිළිබඳ තොරතුරු සඳහන් කරන ලද රෝම මූලාශ්‍රය වන්නේ,
   (1) ඇරිස්ටෝටල්ගේ ඩිමුන්ඩෝ කෘතිය යි.
   (2) ප්ලිනිගේ නැචුරාලිස් හිස්ටෝරියා කෘතිය යි.
   (3) මෙගස්තිනීස්ගේ ඉන්ඩිකා කෘතිය යි.
   (4) ක්වේරෝස් පියතුමාගේ ලංකාව පිළිබඳ කෘතිය යි

6. පහත A සිට D දක්වා ඇති ස්ථාන අතුරින් ප්‍රාග් ඓතිහාසික මානවයාගේ අභිචාර විධි පිළිබඳ .තොරතුරු ඇතුළත් වන ප්‍රකාශ පමණක් ඇති පිළිතුර තෝරන්න.
A- මිනිස් හිස් කබල්වල දෙකට බෙදෙන ලෙස සිදුරු විදීම.
B- මිනිස් භෂ්මාවශේෂ කුඩා මැටි බඳුන්වල තැන්පත් කිරීම.
C- පොළවේ වළ දැමූ විශාල මැටි බඳුන් තුළ භෂ්මාවශේෂ සහිත කුඩා මැටි බඳුන් තැන්පත් කිරිම.
D- මළසිරුර නමා වකුටු කොට වළ දැමීම.
(1) A හා C (2) B හා C (3) B හා D (4) A හා D

7. මුල් ඓතිහාසික යුගයේ රචිත බ්‍රාහ්මී සෙල්ලිපිවල "පුර කමත" යනුවෙන් හඳුන්වා ඇත්තේ,
(1) ගමත් නගරයත් අතර පිහිටි ජනාවාසයකි.
(2) නගරයේ ප්‍රධාන වාස්තු ශිල්පියා ය.
(3) ගම් ප්‍රධානීන් දස දෙනෙකුගෙන් සමන්විත වූ මණ්ඩලයකි.
(4) පවුලක් නියෝජනය කළ ගෘහපතියෙකි.

8. මුල් ඓතිහාසික යුගයේ ආරම්භක ජනාවාස ගංගා නිම්නයට ඇතින් ව්‍යාප්ත වීම කෙරෙහි බල පෑ ප්‍රධානම හේතුව කුමක්ද?
(1) එම ප්‍රදේශවල පස කෘෂිකර්මාන්තයට වඩා යෝග්‍ය වූ නිසා
(2) හේන් වගාව ප්‍රධාන කෘෂිකාර්මික ක්‍රමය වූ නිසා
(3) ගං වතුර පාලනය කිරීමේ ක්‍රමවේද පිළිබඳ අවබෝධයක් නොතිබූ නිසා
(4) නිවාස ඉදි කිරීම සඳහා එම ප්‍රදේශ වඩාත් සුදුසු වූ නිසා

9. අතීතයේ දි ගමිකයින් තෝරා පත්කර ගන්නා ලද්දේ ගෘහපතියන් අතරින් ම බව සඳහන් වන කෘතිය වන්නේ,
(1) ජාතකට්ඨකථාව යි . (2) .සද්ධර්මාලංකාරය ය
(3) සද්ධර්මරත්නාවලිය යි. (4) සමන්තපාසාදිකාව යි

10. ප්‍රථම වරට පරිපාලන දිස්ත්‍රික්ක වෙන් කොට ඒවා පාලනය කිරීම සඳහා වෙන් වෙන් වශයෙන් ඇමතිවරු පත් කරන ලද්දේ,
(1) වසභ රජු විසිනි. (2) පණ්ඩුකාභය රජු විසිනි.
(3) දුටුගැමුණු රජු විසිනි. (4) භාතිකාභය රජු විසිනි.

11. පැරණි ශ්‍රී ලාංකීය සමාජය තුළ "එක්තැන්සමිය" යනුවෙන් හඳුන්වන ලද්දේ,
(1) ව්‍යවස්ථාදායකය, විධායකය, අධිකරණය යි.
(2) ව්‍යවස්ථාදායකය හා විධායකය යි.
(3) විධායකය හා අධිකරණය යි.
(4) ව්‍යවස්ථාදායකය හා අධිකරණය යි.

12. අතීතයේ දී මෙරට පාලකයෝ විදේශිය රටවල් සමඟ සමීප වෙළඳ සබඳතා පැවැත්වූ බව සනාථ වන ප්‍රකාශ කාණ්ඩය ඇතුළත් පිළිතුර කුමක් ද.
A. පළමුවන ගජබාහු රජු ඉන්දියාවේ චේර රාජ්‍යය සමඟ සබඳතා පැවැත්වීම.
B. පළමුවන විජයබාහු රජු කාලිංග දේශය සමඟ සබඳතා පැවැත්වීම.
C. රතුකැට දිවයිනේ රජු හා ඉස්ලාමීය රජු අතර තෑගී හුවමාරු වූ බව මූලාශ්‍රවල සඳහන් වීම.
D. හයවන අග්ගබෝධි රජු චීනය සමඟ රාජ්‍ය තාන්ත්‍රික දූත සබඳතා පවත්වා ගැනීම.
E. භාතිකාභය රජු රෝමානු දේශයට තානාපති නිලධාරීන් යැවීම.
(1) A ,C හා D (2) B ,D හාE (3) C,D හාE (4) A ,C හා D

13. නායක තෙරුන් වහන්සේලා සමීපයේ විසූ ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා පැරණි සෙල්ලිපිවල හඳුන්වා ඇත්තේ කෙසේ ද?
(1) අන්තේවාසික (2) සදිවිහරිය
(3) භාණකවරු (4) වසවසික

14. රජරට ශිෂ්ටාචාර සමයට අයත් පාලි භාෂාවෙන් පමණක් ලිය වී ඇති සාහිත්‍ය කෘති ඇතුළත් පිළිතුර තෝරන්න.
    (1) දීපවංශය, අභිධානප්පදීපිකා, සාරජ්ථදිපනී
    (2) ජානකීහරණය, බාලාවබෝධය, සාරජ්ථදීපනී
    (3) සියබස්ලකර, සසඳාවත, බාලාවබෝධය
    (4) දිපවංශය, සසඳාවත, මුවදෙව්දාවත

15. අතීතයේ, පිටත රතු පැහැයෙන් හා ඇතුළත කළු පැහැයෙන් යුක්ත වන පරිදි මැටි බඳුන් (කාලරක්ත මැටි බඳුන්) සකස්කර ගන්නා ලද්දේ ,
    (1) සකපෝරුව භාවිතා කිරීම මගිනි.
    (2) උඳුන තුළ මැටි බඳුන් රාශියක් උඩුකුරුව නවා පිළිස්සීමෙනි.
    (3) බඳුන තුළට දහයියා පුරවා මැටි බඳුන් යටිකුරුව උඳුනේ නවා පිළිස්සීමෙනි.
    (4) බඳුනේ පිටත ප්‍රදේශ ඔක්සිජන් නොලැබෙන පරිදි ආවරණය කර පිළිස්සීමෙනි.

16. අතීතයේ මහවැව් ඉදිකිරීමේ දී එම වැව්වල සොරොව්වෙ හි ජලය පාලනය කළ උපකරණය හැඳින්වීම සඳහා සෙල්ලිපිවල භාවිත කර ඇති නම කුමක් ද?
    (1) මඩ සොරොව්ව (2) මොහොළ
    (3) ඉස්වැටි (4) කළිඟු බැමි

17. සීගිරි ජල උද්‍යානයේ කාණු පද්ධතිය දහරාකාර ව සකස් කිරීම තුළින් ඉටු කර ගැනීමට බලාපොරොත්තු වී ඇත්තේ,
    (1) ජලය වැඩි කාලයක් කාණු පද්ධතිය තුළ රඳවා තබා ගැනීම යි.
    (2) ජලය ගලා ගෙන යන වේගය පාලනය කිරීම යි.
    (3) කාණු දෙපස ඉවුරු සේදී යාම අවම කිරීම යි.
    (4) ජලයේ ඇති රොන් මඩ ස්වාභාවික ගුරුත්ව බලයෙන් පහළට කිඳා බැස්සවීම යි.

18. රත්නපුර දිස්ත්‍රික්කයේ ගල්පාය ප්‍රදේශයේ සිදු කළ කැනීම්වලින් හමු වූ සාධක වලින් එළඹිය හැකි නිගමනය කුමක් ද ?
    (1) එම ස්ථානය මැටි බඳුන් සෑදීමට යොදාගත් බව
    (2) කිරිමඩු ශාන්තිකර්මය පවත්වන ලද ස්ථානයක් බව
    (3) කෘෂිකාර්මික කටයුතු සඳහා යාතුකර්ම පැවැත්වූ ස්ථානයක් බව
    (4) පූර්වඓතිහාසික යුගයේ භාවිත වූ සුසානයක් බව

19. භාතිකාභය රජු විසින් අනුරාධපුර ප්‍රදේශයේ පිහිටි දාගැබකට එක් කරිසයක් බැගින් ඉඩම් පූජාවක් සිදු කළ බව සඳහන් වන සෙල්ලිපිය වන්නේ,
    (1) කොත්ගල්කන්ද සෙල්ලිපිය යි . (4) නැට්ටුකන්ද සෙල්ලිපිය යි.
    (3) දූනුමඩලාකන්ද සෙල්ලිපිය යි. (4) වෙහෙරකෙම සෙල්ලිපිය යි.

20 .අතීතයේ සිට තම දියණිවරුන් සූපශාස්ත්‍රයෙහි නිපුණ කරවීම දෙමාපියන් සතු වගකීමක් බව සඳහන් වන කෘතිය කුමක් ද?
    (1) සද්ධර්මාලංකාරය (2) සහස්සවත්ථුපකරණය
    (3) සද්ධර්මරත්නාවලිය (4) රසවාහිනිය

21. අතීත ශ්‍රී ලංකාවේ ජනතාව පරිභෝජනය කරන ලද ආහාර හා ඒ සඳහා භාවිත කළ පැරණි නම් පහත දැක්වේ. “අ“ හා “ආ“ තීරු ගළපා නිවැරදි පිළිතුරු තෝරන්න.

| “අ“ තීරුව | “ආ“ තීරුව |
|---|---|
| 1. ගිතෙල් මිශ්‍ර මොනර මස් | A කටුක භාණ්ඩ |
| 2. ධාන්‍ය වර්ග බැඳ කුඩු කර සකස් කළ ආහාර | B ප්‍රභුවරුන්ගේ ආහාර |
| 3. ව්‍යංජන රසවත් කිරීමට යොදාගත් කුළුබඩු | C කාඩි ඇඹුල |
| 4. සහල් පිටි පල්කර සකස් කළ ආහාර | D අත්සුණු |

(1) ABDC (2) ACBD (3) BACD (4) BDAC

22. පහත A සිට D දක්වා වූ නිර්මාණ අතුරෙන් අග්නිදිග ආසියාතික වාස්තු විද්‍යාත්මක ලක්ෂණ මැනවින් ඉස්මතු වී පෙනෙන පිළිතුර තෝරන්න.

A. මහමෙව්නා උයනේ සමාධි පිළිමය
B. පොලොන්නරුවේ සත් මහල් ප්‍රාසාදය
C. අවුකන බුදු පිළිමය
D. ගල් විහාර බුද්ධ ප්‍රතිමා

(1) A හා C (2) B හා C (3) B හා D (4) C හා D

23. යාපනය රාජධානිය පාලනය කළ ආර්ය චක්‍රවර්තී පරපුරේ පාලකයන් දොළොස් දෙනෙකු පිළිබඳ සඳහන් කෘතිය වන්නේ කුමක් ද?
(1) ශේගරාසසේකරමාලෛ (2) යාල්පාන වෛපමාලෛ
(3) පදිර්රුපත්තු (4) සීලප්පාදිකාරම්

24. මහනුවර රාජධානි සමයේ ප්‍රාදේශීය පාලන ඒකක බෙදී තිබූ ප්‍රධාන කොටස් දෙක මොනවා ද?
(1) රට හා දිසාව (2) රට හා කෝරළ
(3) දිසාව හා කෝරළ (4) කෝරළ හා පත්තු

25.යුරෝපා ඉතිහාසය තුළ මධ්‍යතන යුගය ලෙස හඳුන්වනු ලබන්නේ,
(1) ග්‍රීක හා රෝම ශිෂ්ටාචාර පැවති කාලය යි.
(2) රෝම ශිෂ්ටාචාරය බිඳවැටීමෙන් පසු වසර දහසක පමණ කාලය යි.
(3) ඇබර්ජීන්වරු බලවත්ව සිටි කාලය යි.
(4) මිනෝවන් ශිෂ්ටාචාරය යුරෝපය තුළ ව්‍යාප්තව තිබූ කාලය යි.

26. ක්‍රි.ව 1638 මඩකලපුවේ පිහිටි පෘතුගීසී බලකොටුවට පහර දීම සඳහා දෙවන රාජසිංහ රජුට සහය ලබා දුන් ලන්දේසි නාවික හමුදා අණදෙන නිළධාරියා කවුරුන් ද?
(1) බැරන් වැන් එක් (2) විලෙම් ෆැලෙක්
(3) ෆන් හුන්ස් (4) වෙස්ටර්වෝල්ඩ්

27. කාර්මික විප්ලවයත් සමඟ ධනවාදී ආර්ථික රටාව තුළ වෙළඳාම වේගයෙන් ව්‍යාප්ත විය.ඒ තුළින් ආයෝජන ක්ෂේත්‍රයේ ඇති වූ නව ප්‍රවනතාවයක් වූයේ,
(1) වැටුප මත සේවය කරන කම්කරු පංතියක් බිහිවීම යි.
(2) සේවක වැඩ වර්ජන හා අයිතිවාසිකම් දිනා ගැනීම සඳහා සටන් ඇති වීම යි.
(3) බද්ධ ව්‍යාපාර සමාගම් හා බහු ජාතික සමාගම් බිහිවීම යි.
(4) පංති සහිත සමාජයක් නිර්මාණය වීම යි.

28.ක්‍රි.ව 1623 දී ලන්දේසීන් විසින් අග්නිදිග ආසියාතික ප්‍රදේශවල ඉංග්‍රීසින්ගේ බලය ව්‍යාප්ත වීම වැළැක්වීම සඳහා පහර දෙන ලද ඉංග්‍රිසි බල කොටුව පිහිටා තිබුණේ,
(1) ඇම්බොයිනා දූපතේ ය. (2) ජාවා දූපතේ ය.
(3) සුමාත්‍රා දූපතේ ය. (4) පිලිපීන දූපත්වල ය.

29. ඉංග්‍රීසි වෙළඳ සමාගම විසින් මුහුදුබඩ ප්‍රදේශවල ක්‍රියාත්මක කළ මදුරාසි පාලනය යටතේ ආදායම් එකතු කිරීම සඳහා පත්කළ සහකාර පරීක්ෂකවරුන් හඳුන්වන ලද්දේ,
(1) අවුමිල්දාර්වරු යනුවෙනි. (2) රෙසිඩන්ට්වරු යනුවෙනි.
(3) කොමදෝරුවරු යනුවෙනි. (4) කලෙක්ටර්වරු යනුවෙනි.

- ශ්‍රී ලංකාවේ ආගමික පුනර්ජීවන ව්‍යාපාරය හා සම්බන්ධව පහත සඳහන් තොරතුරු අදාළ කරගනිමින් අංක .දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න 32 සිට 30

| | | |
|---|---|---|
| A අනගාරික ධර්මපාලතුමා | D උදයභානු | G මද්රාසා පාසල් |
| B ආරුමුග නාවලර්තුමා | E මුස්ලිම් නෙයිසන් | H ගම්පොල ජිනරාජ විද්‍යාලය |
| C සිද්දි ලෙබ්බෙ මහතා | F මහාබෝධි සභාව | I ශිවන්ගල විද්‍යාලය |

30. බෞද්ධ ආගමික පුනර්ජීවන ව්‍යාපාරයට අයත් තොරතුරු ඇතුළත් ප්‍රකාශය තෝරන්න.

(1) A,E සහ I (2) A, F සහ G (3) A, F සහ H (4) A, D සහ I

31. ඉස්ලාමීය ආගමික පුනරුද ව්‍යාපාරයට අයත් තොරතුරු ඇතුළත් ප්‍රකාශය තෝරන්න .

(1) B,E සහ G (2) C ,E සහ G (3) B, E සහ I (4) C ,E සහ I

32. හින්දු ආගමික පුනරුද ව්‍යාපාරයට අයත් තොරතුරු ඇතුළත් ප්‍රකාශය තෝරන්න.

(1) B, E සහ I (2) C ,D සහ I (3) B, E සහ H (4) B, D සහ I

33. මෙරට වාමාංශික නායකයන් විසින් නිදහස ඉල්ලා ගෙන ගිය උද්ඝෝෂණ වල ප්‍රචාරක කටයුතු සඳහා ක්‍රියාත්මක කරන ලද වැඩපිළිවෙළ හඳුන්වන ලද්දේ කුමන නමකින් ද?

(1) සූරිය මල් ව්‍යාපාරය (2) පොපිමල් ව්‍යාපාරය
(3) ජාතික ව්‍යාපාරය (4) අමද්‍යප ව්‍යාපාරය

34. අප රට බ්‍රිතාන්‍ය යටත් විජිතයක් ව පැවතීම නිසා මෙරට ට උරුම වූ ප්‍රයෝජනවත් අංගයක් නොවන්නේ,

(1) ඉංග්‍රීසි භාෂා දැනුම රට තුළ පැතිරීම.
(2) පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමය හඳුන්වා දීම.
(3) බටහිර සංස්කෘතික අංග රට තුළ පැතිරීම.
(4) කාර්මික විප්ලවයේ බලපෑම් මෙරටට ලැබීම.

- පහත A, B , Cහා . D වලින් දැක්වෙන ප්‍රකාශ පද යුගල/අධ්‍යයනය කර, අංක දක්වා 38 සිට 35ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - 1 අපනයන වතු වගාව ආරම්භ කිරීම
2 ඉඩම් අහිමි ජනතාවක් බිහිවීම

B - 1 ඇමෙරිකානු නිදහස් සටන
2 බැස්ටීලයට පහරදීම

C - 1 ආයාත ආදේශක ප්‍රතිපත්තිය
2 ඒකල කාර්මික ජනපදය පිහිටුවීම

D - 1 ජාතීන්ගේ සංගමය
2 දෙවන ලෝක සංග්‍රාමය

35. පළමුවැන්නේ සාර්ථකත්වයට දෙවැන්න බලපෑ බව දක්වන පද යුගලය,
(1) A (2) B (3) C (4) D

36. දෙවැන්නේ ආරම්භයට පළමුවැන්න බලපෑ බව දක්වන පද යුගලය,
(1) A (2) B (3) C (4) D

37. පළමුවැන්න හා දෙවැන්න අතර සම්බන්ධයතාවයක් නොදක්වන පද යුගලය,
(1) A (2) B (3) C (4) D

38. පළමුවැන්න බිඳවැටීම කෙරෙහි දෙවැන්නේ ආරම්භය බලපෑ බව දක්වන පද යුගලය,

(1) A (2) B (3) C (4) D

39. දෙවන ලෝක යුද්ධයෙන් පසු ධනවාදී හා සමාජවාදී බල කඳවුරුවලට සම්බන්ධ නොවී ස්වාධීනව කටයුතු කිරීමේ අරමුණින් රටවල් එකතු වී පිහිටුවාගත් සංවිධානය කුමක් ද?

(1) නේටෝ සංවිධානය (2) වෝර්සෝ සංවිධානය
(3) එක්සත් ජාතීන්ගේ සංවිධානය (4) නොබැඳි ජාතීන්ගේ සංවිධානය

40. පහත සඳහන් ප්‍රකාශ අතුරින් එක්සත් ජාතීන්ගේ සංවිධානය සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය කුමක් ද?

(1) ස්වීඩනය හා ෆින්ලන්තය අතර ඇති වූ යුද ගැටුම් වළක්වාලීම සඳහා මැදිහත්වීම.
(2) සූවස් අර්බුදය විසඳීම සඳහා මැදිහත්වීම.
(3) ඉරාකය හා කුවේටය අතර ඇතිවීමට ගිය ගැටුම් වළක්වාලීම සඳහා මැදිහත්වීම.
(4) කියුබානු මිසයිල අර්බුදය විසඳීම සඳහා මැදිහත්වීම

*****

දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
**Ministry of Education, Sri Lanka**

| 33 | S | II |
|---|---|---|

**අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2022 (2023)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை- ஆதரவு கருத்தரங்கு தொடர்- 2022 (2023)**
**G. C. E. Ordinary Level Examination - Support Seminar Series - 2022 (2023)**

| | |
|---|---|
| ඉතිහාසය | I, II |
| வரலாறு | I, II |
| History | I, II |

**ඉතිහාසය II**

- **I** කොටසේ ප්‍රශ්න අංක **1** අනිවාර්ය වේ.
- **II** කොටසින් ප්‍රශ්න **හතරකට** ද, **III** කොටසින් ප්‍රශ්න **එකකට** ද පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **හයකි.**

## I කොටස

1. (අ) (I) පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ලකුණු කර නම් කරන්න.

නාගදීපය, යාන් ඔය, ඉරණමඩු ජලාශය, කලාවැව, කල්පිටිය, මිනිපේ අමුණ , මඩකලපුව ජජ්ජර නදී, ගොඩවාය, කාවරගාම, පාහියන්ගල, ගන්නෝරුව (ලකුණු 12)

(II) පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ලකුණු කර නම් කරන්න.
ලිස්බන්, රෝමය, ගෝව, කල්කටා, තායිවානය, කොරියානු අර්ධද්වීපය (ලකුණු 06)


(ආ) (i) පහත A,B,C, හා D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරුවලට අදාළ පිළිතුරු **අනුපිළිවෙලින්** ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න .

A. පොළොන්නරු රාජධානියේ ආරම්භක පාලකයා
B. භික්ෂූන් වහන්සේලාට වැඩ වාසය කිරීමට පන්, ඉලුක් ආදිය සෙවිලි කොට ඉදි කළ නිවාස
C. විශාල මැටි බඳුන් ළිඳ තුළට බස්සවා බිත්ති ආවරණය කොට සකස් කරන ලද ළිං
D. ප්‍රථම වරට කෝට්ටේ ශක්තිමත් බලකොටුවක් ඉදි කළ පුද්ගලයා

(ලකුණු 04)

- A හා B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක **අනුපිළිවෙළින්** ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න

A රූපය



(II) 1. යාබද A රූපයේ දැක්වෙන්නේ මොනවා ද?
2 .මේවා හමු වූයේ කුමන ස්ථානයකින් ද?
3 . මෙම උපකරණ නිපදවා ඇති මාධ්‍ය කුමක් ද?
4. මේවා භාවිත කර ඇත්තේ කුමන කාර්යයක් සඳහා ද?

(ලකුණු 04)

B රූපය



(iii) 1. යාබද B රූපයේ දැක්වෙන්නෙ කවුරුන් ද?
2 . ඔහු ජීවත් වූ රට කුමක් ද?
3 . ඔහු අයත් වන රාජවංශය නම් කරන්න.
4. මෙම පාලකයා ජීවත් වූ සුඛෝපභෝගී මන්දිරය හැඳින්වූ නම කුමක් ද?

(ලකුණු 04)

II කොටස

02. (I) ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගයට අයත්,
A මැටි ඔරු සුසාන පැවති ස්ථාන දෙකක් සහ
B ශිලා මංජුසා සුසාන පැවති ස්ථානයක් නම් කරන්න. (ලකුණු 03)

( II) ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්ත වීම කෙරෙහි බලපෑ ප්‍රධාන සාධක දෙකක් නම් කරන්න. (ලකුණු 04)

(III) පූර්ව ඓතිහාසික යුගයේ මානවයාගේ තාක්ෂණික දියුණුව උඩරංචාමඩම නේවාසික ස්ථානයෙන් හමු වූ තොරතුරු ආශ්‍රයෙන් කරුණු දෙකක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(IV) පහත ජනාවාසවල ස්වරූපය හා කාර්යභාරය ඇසුරෙන් මුල් ඓතිහාසික යුගයේ ජනාවාසවල ස්වරූපය කෙටියෙන් පැහැදිලි කරන්න
A. ගම
B. නගරය
C. පුරය ( 06 ලකුණු))

03. (I) පහත A B C යටතේ දක්වා ඇති එක් එක් ප්‍රකාශයට අදාළ තොරතුරු වරහන් තුළින් තෝරා ලියන්න.
A මහාවංශයේ අර්ථ විවරණය කිරීම සඳහා ලියන ලද ටීකාව
B ගම්පොළ රාජධානි සමයේ මෙරට ට පැමිණි අරාබි ජාතික දේශාටකයා
C ගල්ලෙන්වල කටාරම් අසල ලියූ ලිපි

(ගිරිලිපි, ඉබන් බතුතා, විනයට්ඨකථා මහාවංසය, සුලෙයිමාන්, ලෙන්ලිපි, වංසත්ථප්පකාසිනී)

(ලකුණු 03)

(II) ඉතිහාසය ගොඩනැගීම සඳහා සාහිත්‍ය මූලාශ්‍රය යොදා ගැනීමේදී සැලකිලිමත් විය යුතු කරුණු හතරක් ලියන්න. (ලකුණු 04)

(III) ඉතිහාසය හැදෑරීම සඳහා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය යොදා ගැනීමෙන් අපට ලැබෙන ප්‍රයෝජන දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(IV) පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය ආරක්ෂා කර ගැනීම සඳහා අප යොමු විය යුත්තේ ඇයි දැයි කරුණු තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

04. (I) දේශපාලන බලය මධ්‍යගත වීමේ ක්‍රියාවලියේ දී රටේ ප්‍රධාන පාලකයාබවට පත්වන රජතුමාගෙන් ජනතාව අපේක්ෂා කළ ප්‍රධාන යුතුකම් තුනක් නම් කරන්න. (ලකුණු 03)

(II) අතීත ජනතාව වැව් පද්ධතියක් (එල්ලංගාව) සෑදීම තුළින් ඉටුකර ගැනීමට අපේක්ෂා කළ ප්‍රධාන අරමුණු දෙකක් නම් කරන්න. (ලකුණු 04)

(III) මෙරට දේශපාලන බලය මධ්‍යගත කිරීම සඳහා දේවානම්පියතිස්ස රජු ගන්නා ලද ක්‍රියාමාර්ග දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(IV) චෝල පාලනයෙන් මුදා ගෙන මෙරට නැවත එක්සේසත් කිරීම සඳහා පළමුවන විජයබාහු රජු විසින් ගන්නා ලද ක්‍රියාමාර්ගය කරුණු තුනක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

05 (I) වසභ රජු විසින් අඹන් ගඟ හරස් කොට ඉදිකරන ලද ඇළහැර ඇළෙන් ජලය සපයන වැව් තුනක් නම් කරන්න. (ලකුණු 03)

(II) පහත A සිට B දක්වා ඇති තොරතුරු සඳහා අදාළ වන පිළිතුරු වරහන් තුළින් තෝරා ලියන්න.

A. වෙර යොදා බලයක් යෙදීමෙන් ගල් පතුරු ගලවා මෙවලම් තැනීමේ තාක්ෂණය

B. අතීතයේදී ඇළ මාර්ග තැනීම සම්බන්ධයෙන් කටයුතු කළ පුද්ගලයන් හැඳින්වූ නම

C. දිග මැනීම සඳහා භාවිත කළ කුඩා ම ඒකකය

D. වැසි ජලය ලෙන තුළට පැමිණීම වැළැක්වීම සඳහා ලෙනෙහි පියස්සේ කළ නිර්මාණය

(ආංගුලය, අඩික, හවජර, පීඩන ශල්කනය, පරමාණුව, කටාරම, ගාවුත කණු )

(ලකුණු 04)

(III) රාජ්‍ය අනුග්‍රහය යටතේ විශාල වාරි පද්ධති නිර්මාණය වීම සඳහා බලපෑ කරුණු දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(IV) A - ලංකාවේ පැරණි යකඩ නිස්සාරණ තාක්ෂණය පිළිබඳව තොරතුරු හමුවන ස්ථාන දෙකක් ද, (ලකුණු 02)

B - එම එක් එක් ස්ථානයන්හි යකඩ නිස්සාරණය කිරීම සඳහා යොදා ගන්නා ලද ක්‍රමවේදයන් ද විස්තර කරන්න. (ලකුණු 04)

06 (I) මහනුවර රාජධානිය හැඳින්වීම සඳහා භාවිතකළ වෙනත් නම් තුනක් ලියන්න. (ලකුණු 03)

(II) පහත A සිට D දක්වා ඇති ප්‍රකාශ සඳහා අදාළ පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

A. සිංහල රජ පෙළපතේ අවසන් පාලකයා

B. කන්නසාමි කුමරුට උඩරට රාජ්‍යත්වය ලබාගැනීමට සහය දුන් ප්‍රභූවරයා

C. අදිකාරම්වරුන්ගේ පණිවිඩ ප්‍රාදේශීය නිලධාරීන්වෙත ගෙනගිය පුද්ගලයා

D. පෘතුගීසීන් විසින් තමන්ට ගැති පාලකයෙකු ලෙස පළමු වරට උඩරට ප්‍රදේශය පාලනය සඳහා පත්කළ පුද්ගලයා

( ජයවීර බණ්ඩාර, ශ්‍රී විර පරාක්‍රම නරේන්ද්‍රසිංහ, වීරසුන්දර බණ්ඩාර,යමසිංහ බණ්ඩාර, කටුපුල්ලේ වරු, පිළිමතලව්වේ අදිකාරම්,විදානේ වරු) (ලකුණු 04)

(III) උඩරට රාජධානිය සම්බන්ධයෙන් ලන්දේසීන්ගේ ප්‍රතිපත්තියේ කැපී පෙනුණු ලක්ෂණ දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(IV) සීතාවක රාජධානියේ බල වර්ධනයට මෙන්ම බිඳවැටීමට ද පළමුවන රාජසිංහ රජුගේ ක්‍රියා කලාපය බලපෑබව කරුණු තුනක් මගින් විස්තර කරන්න. (ලකුණු 06)

07 (I) දහහත්වන සියවස අගභාගය වනවිට ඉන්දියාව තුළ,

A - ඉංග්‍රීසින් විසින් පිහිටුවාගත් වෙළඳ මධ්‍යස්ථාන දෙකක් ද,

B - ප්‍රංශ ජාතිකයන් විසින් පිහිටුවාගත් වෙළඳ මධ්‍යස්ථානයක් ද ලියන්න. (ලකුණු 03)

(II) 1803 ඉංග්‍රීසීන්ගේ උඩරට ආක්‍රමණය අසාර්ථක වීමට බලපෑ ප්‍රධාන හේතු දෙකක් නම් කරන්න. (ලකුණු 04)

(III) 1818 නිදහස් සටන සඳහා බලපෑ ප්‍රධාන හේතු දෙකක් විස්තර කරන්න.

(ලකුණු 05)

(IV) 1848 නිදහස් සටන ආරම්භ වීම කෙරෙහි බලපෑ කෝල්බෲක් ප්‍රතිසංස්කරණ තුනක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

III කොටස

08 (I) පුනරුද සමයේ , කතෝලික සභාවේ දුර්වලතා විවේචනයට ලක් කල පුද්ගලයන් තිදෙනෙකු නම් කරන්න. (ලකුණු 03)

(II A- පෙරදිගට පැමිණීම සඳහා නව වෙළෙඳ මාර්ග සොයා ගැනීම කෙරෙහි යුරෝපා ජාතීන් පෙළඹීමට බලපෑ ප්‍රධාන හේතු දෙකක් හා

B - ඒ සඳහා උපකාරී වූ නව සොයාගැනීම් දෙකක් නම් කරන්න. (ලකුණු 04)

(III) පුනරුදයේ ගෝලීය ප්‍රවනතාවය කරුණු දෙකක් යටතේ විස්තර කරන්න. (ලකුණු 05)

(IV) පුනරුදය නිසා ලෝක දේශපාලන ක්ෂේත්‍රයේ සිදුවූ වෙනස්කම් තුනක් සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 06)

09 (I) බ්‍රිතාන්‍යයන් විසින් තම ආදායම වැඩිකර ගැනීම සඳහා ඇමෙරිකානු ජනපදවාසීන් වෙත පනවන ලද නව බදු පනත් තුනක් නම් කරන්න. (ලකුණු 03)

(II) පළමුවන ලෝක සංග්‍රාමයට සම්බන්ධ වූ,


A - මිත්‍ර පිලේ රටවල් දෙකක් ද , (ලකුණු 02)


B - මධ්‍යම බලවතුන්ගේ පිලේ රටවල් දෙකක් ද නම් කරන්න. (ලකුණු 02)

(III) ප්‍රංශ විප්ලවයට බලපෑ දේශපාලන හේතු දෙකක් විස්තර කරන්න (ලකුණු 05)

(IV) ජර්මනියේ හිට්ලර්ගේ ක්‍රියාකලාපය දෙවන ලෝක සංග්‍රාමය ආරම්භවීම කෙරෙහි සෘජුවම බලපෑ බව කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

*****


උ/N/வ


N
Indian Ocean
Africa